මගේ අංක : ඩී5/සැරයන්/උසස් වීම/2016
බන්ධනාගාර මූලස්ථානය,
බේස්ලයින් පාර,
කොළඹ 09.
2016.04. 12

සියළුම බන්ධනාගාර අධිකාරින් සහ,
සහකාර බන්ධනාගාර අධිකාරින් වෙත

<u>බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිළධාරීන් ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත</u>
<u>බන්ධනාගාර සැරයන් තනතුරට උසස් කිරීම- 2016</u>

මෙම දෙපාර්තමේන්තුවේ පවතින බන්ධනාගාර සැරයන් තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා තනතුරේ ස්ථිර කර ඇති, පහත සඳහන් දිනයට හෝ ඊට පෙර බන්ධනාගාර නියාමක තනතුරට පත් වූ නිළධාරීන්ගෙන් හා නිලධාරිණීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

I . පිරිමි නිලධාරීන් - 1998.09.01 දිනට පෙර
II. කාන්තා නිලධාරීන් - 1998.09.01 දිනට පෙර

02. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 2/3 ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය මතද ඉතිරි 1/3 සීමිත තරග විභාගයකින් (ලිඛිත) තෝරා ගනු ලැබේ.

03. ඒ අනුව ජ්‍යෙෂ්ඨතාවය මත සැරයන් (පිරිමි) තනතුරු 122 සහ සැරයන් (කාන්තා) තනතුරු 04 සම්පූර්ණ කිරීමට නියමිතය. (පවත්නා පුරප්පාඩු අනුව 1:5 අනුපාතයට සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ)

04. වැටුප් ඛණ්ඩය හා පරිමානය :-

I. වැටුප් ඛණ්ඩය - RS-2-2016 PS රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව

II. වැටුප් ඛණ්ඩය - 32010 - 9 x 370 - 17 x 495 - 43755

05. කාර්යක්ෂමතා කඩඉම් :-

කාර්යක්ෂමතා කඩඉම සැරයන් තනතුරට පත්ව වසර තුනක් (3) ඇතුලත සමත් විය යුතුය.

06. සැරයන් තනතුරේ උසස් කිරීමේ ක්‍රමවේදය :-

**06.I ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය මත සැරයන් තනතුර උසස් කිරීම.**

පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 2/3 ක් ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය මත හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සැරයන් තනතුරට උසස් කරනු ලැබේ. උපරිම ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල අනුව පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. පත්වීම් ලබා දීම සලකා බැලීම සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී 40%ක ලකුණු ලබා ගත යුතු ය. නමුත් පත්වීම් ලබා දෙනු ලබන්නේ පුරප්පාඩු සංඛ්‍යාවට අනුව ඉහළම ලකුණු ලබා ගත් අයදුම් කරුවන්ට පමණි. තවද සම්මුඛ පරීක්ෂණයට කැඳවීම පත්වීමක් ලැබීමට සුදුසුකමක් නොවේ.

**06.I.1. සපුරා ලිය යුතු මූලික සුදුසුකම් :-**

I. පත්වීම් ස්ථිර කර තිබීම.
II. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට නියාමක ශ්‍රේණියේ අවම වශයෙන් වසර අටක (08) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක (08) උපයාගෙන තිබීම.
III. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්ව තිබීම.
IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහක් (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
V. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතාව ලබා ගෙන තිබීම.
VI. අනුමත කාර්ය සාධක ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර අට (08) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

**සටහන් :-**

✓ සක්‍රිය සේවා කාලය යනු :

ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලු වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

✓ සතුටුදායක සේවා කාලයක් යනු :

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින්හි XVII වැනි පරිච්ජේයෙ 186(I) වගන්තිය අනුව රජයේ නිළධාරියක් විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරිම මගින්ද,සමත් විය යුතුව තිබු කාර්යක්ෂමතා කඩඉම් සමත්විම මඟින්ද, සිදු කළ යුතුව තිබු පත්විම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරිම මඟින්ද,එම කාලය තුළ දී උපයාගත යුතුව තිබු සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ විසින් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින්හි XVII වැනි පරිච්ජේදයේ 186(II) වගන්තිය අනුව නිළධාරියා වෙත ලබා දිය යුතුව තිබු වාර්ෂික වැටුප් වර්ධක නිත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩු කොට,නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එයද, වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛන යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබු දින සිට වසර තුනක කලයක්ද, සහ වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබු දින සිට එක් වසරක කාලයක් සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදි බැහැර කළ යුතු වන්නේය.

**06.I.2. අයදුම්පත් යොමු කල යුතු ආකාරය :-**

✓. ඉහත දක්වා ඇති මුලික සුදුසුකම් කර ඇති නිළධාරින් සම්බන්ධව මෙම නිවේදනය අවසානයේ, ඇමුණුම් අංක 1 ලෙස අමුණා ඇති ආදර්ශ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර ඔබගේ නිර්දේශය සහිතව (නම සහිත නිල මුද්‍රාව තබා නිර්දේශ කල යුතු වේ.) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2016.05.10 දිනට ප්‍රථම ලැබෙන සේ බන්ධනාගාර කෙමසාරිස් ජනරාල් වෙත එවිය යුතුය.

✓. නියමිත ආදර්ශ ආකෘතියට අදාළ නොවන අයදුම්පත්, නිසි ලෙස නොකරන ලද එමෙන්ම නියමිත දිනයට පසුව එවනු ලබන අයදුම්පත් කිසිදු දැනුමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| ලකුණු ලබා දෙන ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. ජොෂ්ඨත්වය (නියාමක තනතුරේ වසර 05ට පසු) | 60 | අදාළ නොවේ. |
| 2. ප්‍රශංසා | 05 | |
| 3. ක්‍රීඩා | 10 | |
| 4. සුභසාධක හා ආගමික කටයුතු | 05 | |
| 5.යහපත් සේවයට වාර්තා කිරීම (පසුගිය වසර 05 තුළ) | 05 | |
| 6.විෂය සමගාමී පාඨමාලා සහ වෙනත් උසස් අධ්‍යාපන සුදුසුකම් | 05 | |
| 7. සේවා කුසලතාවය | 05 | |
| 8. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

**06.I.3. ව්‍යුහගත සම්මුඛ පරික්ෂණයේ ලකුණු ලබා දීමේ ක්‍රමවේදය (ජොෂ්ඨතාවය හා කුසලතාවය මත ) :-**

I. ජොෂ්ඨතාවය සඳහා (ලකුණු 60)

(අ).

- නියාමක තනතුරේ වසර පහක (05) කාලයකට පසුව එළඹෙන සේවා කාලය වසර එකක් (01) ක් සඳහා (ලකුණු 03)
- සේවා කාලය මාස හයක් සඳහා (06) ක් හෝ ඊට වැඩි කාලයක් සඳහා (ලකුණු 1, 1/2)

(ආ). විදේශ නිවාඩු ලබා විදේශ ගත වූ කාලයකට සහ ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ නියෝජිත ආයතන වල සහ විදේශ අරමුදල් යොදවනු ලබන ව්‍යාපෘති වල රැකියාවන් සඳහා වැටුප් රහිත නිවාඩු ලබා ඇති කාල සීමාවන්ට, වෙනත් හේතු මත වැටුප් රහිත නිවාඩු මත සිටින කාලයක් හා වැටුප් වර්ධක ගෙවීම් ප්‍රතික්ෂේප කර, අසතුටුදායක සේවා කාලයක් සඳහා ද ලකුණු ලබා දීමක් සිදු නොවේ.

II. කුසලතාවය සඳහා (උපරිම ලකුණු 40)
මෙහිදි ලබා දෙනුයේ වර්තමාන සේවා කාලයක් තුළදී කරන ලද කටයුතු වෙනුවෙන් පමණි.

**(අ). ප්‍රශංසා ( උපරිම ලකුණු 05)**

a) බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් දෙනු ලබන ප්‍රශංසාවකට (ලකුණු 02)
b) බන්ධනාගාර අධිකාරි ප්‍රශංසාවකට (ලකුණු 01)

**(ආ). ක්‍රීඩා (උපරිම ලකුණු 10)**

a) බන්ධනාගාර නියෝජනය කර ජය ගැනීම එක් ක්‍රීඩාවකට (ලකුණු 01)
b) දෙපාර්තමේන්තුව නියෝජනය කර ජය ගැනීම එක් ක්‍රීඩාවකට (ලකුණු 02)
c) රාජ්‍ය සේවා නියෝජනය කර ජය ගැනීම එක් ක්‍රීඩාවකට (ලකුණු04)
d) මව් රට නියෝජනය එක් ක්‍රීඩාවකට (ලකුණු 05)

**සටහන :-**

එක් ක්‍රීඩාවකට ලකුණු ලබා දෙනුයේ ඉහළම නියෝජනයන් සඳහා පමණි. මේ යටතේ ලැබූ ජයග්‍රහන සඳහා ලද ප්‍රශංසා වෙනුවෙන් ඉහත II - (අ) යටතේ නැවත ලකුණු දෙනු නොලැබේ.

**(ඇ). සුභ සාධක හා ආගමික කටයුතු (උපරිම ලකුණු 05)**

දෙපාර්තමේන්තුවේ හෝ බන්ධනාගාර ආයතන තුළ සුභ සාධක කටයුතු හා ආගමික කටයුතු හා සම්බන්ධ සමිතියක නිල තල දැරීම වෙනුවෙන් මේ යටතේ ලකුණු දෙනු ලැබේ.(වසරකටම)

a) දෙපාර්තමේන්තු මට්ටම සංගමයක සභාපති,ලේකම්,භාණ්ඩාගාරික තනතුරට (ලකුණු 02)
b) වෙනත් තනතුරකට (ලකුණු 01)
c) ආයතන මට්ටමේ සමිතියක සභාපති , ලේකම්, භාණ්ඩාගාරික තනතුරට (ලකුණු 01)
d) වෙනත් තනතුරකට (ලකුණු 01)

**(ඈ). පසුගිය වසර 05 තුළ යහපත් සේවයට වාර්තා කිරීම ( 2011.03.01 - 2016.02.29 )**

a) දින 1450 හෝ ඊට වැඩි (ලකුණු 05)
b) දින 1350 - 1450 අතර (ලකුණු 04)
c) දින 1300 - 1350 අතර (ලකුණු 03)
d) දින 1200 - 1300 අතර (ලකුණු 02)
e) දින 1150 - 1200 අතර (ලකුණු 01)

**(ඉ). විෂය සමගාමී පාඨමාලා සහ වෙනත් උසස් අධ්‍යාපන සුදුසුකම් (ලකුණු 05)**

(ඊ). **සේවා කුසලතාවය (ලකුණු 05)**

| | | |
|---|---|---|
| a) | උපාධිය | (ලකුණු 05) |
| b) | ඩිප්ලෝමා පාඨමාලා වසර 01 ට වැඩි | (ලකුණු 03) |
| c) | සහතික පත්‍ර පාඨමාලා මාස 06 ට වැඩි | (ලකුණු 02) |
| d) | සහතික පත්‍ර පාඨමාලා මාස 03 ට වැඩි | (ලකුණු 01) |
| e) | විෂය සමගාමී කෙටිකාලීන වැඩමුළු / වැඩ සටහන් | (ලකුණු 1/2) |

(උ). **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව (ලකුණු 05)**

| | | |
|---|---|---|
| a) | ආරක්ෂක කාර්ය භාර නිලධාරී | (ලකුණු 01) |
| b) | ක්ෂේත්‍ර සේවා කාර්ය භාර නිලධාරී | (ලකුණු 01) |
| c) | දොරටු භාර නිලධාරී | (ලකුණු 01) |
| d) | මුළුතැන්ගෙයි භාර නිලධාරී | (ලකුණු 01) |
| e) | කාර්යාල කාර්ය භාර නිලධාරී | (ලකුණු 01) |

එච්. එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට

[illegible] එම්.එන්.සී. ධනසිංහ
[illegible] ගාර කොමසාරිස් [illegible] ල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

## <u>ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය මත සැරයන් තනතුරට උසස් කිරීම - අයදුම්පත්‍රය</u>

පුද්ගලික ලිපිගොනු අංකය :- ....................................

1. නිළධාරියාගේ / නිළධාරිනියගේ නම :- ..........................................................................................

2. ස්ථිර නියාමක තනතුරට පත් වූ දිනය :- ..........................................................................................

   I. 2016.03.31 වෙනි දිනට සේවා කාලය :- අවු :............. මාස:............... දින:.............

   II. තනතුර ස්ථිර කර ඇති ලිපියේ අංකය සඳහන් කරන්න ..........................................................

   III. ජ්‍යෙෂ්ඨත්වය පහත හෙළා ඇත්නම් ඒ ලිපිබඳ විස්තර :- ..........................................................

..........................................................................................

3. 2016.03.31 දිනට පූර්වාසන්න වසර 03 තුල දෝෂ දර්ශනයට ලක්වී තිබේද ? ඔව්/නැත

   (ඔව් නම් විස්තර සඳහන් කරන්න) :- ..........................................................................................

..........................................................................................

4. II. විසදීමට විනය පරීක්ෂණ තිබේද ? ඔව්/ නැත

   (ඔව් නම් විස්තර සඳහන් කරන්න) :- ..........................................................................................

..........................................................................................

III. 2016.03.31 වෙනි දිනට පූර්වාසන්නයේ වසර 05 තුල වැටුප් වර්ධක උපයාගෙන තිබේද ? ඔව්/නැත

( පිළිතුර නැත නම් විස්තර සඳහන් කළ යුතුය).

IV. වැටුල් රහිත විදේශ නිවාඩු ලබා ඇත්නම් එම විස්තර :- ..........................................................

..........................................................................................

VI. ලබාගෙන ඇති අඩ වැටුප් හා වැටුප් රහිත නිවාඩු පිලිබඳ විස්තර :- ..........................................................

..........................................................................................

ඉහත සඳහන් තොරතුරු සතය හා නිවරදි බව සහතික කරමි.

දිනය : ................................................ අයදුම්කරුගේ අත්සන : ..........................................

**බන්ධනාගාර අධිකාරිය විසින් සම්පූර්ණ කල යුතුය.**

1) ඉහත 1 හා 3 දක්වා නිළධාරියා විසින් සඳහන් කර ඇති කරුණු නිවරදි නොවන්නේ නම් නිවරදි තොරතුරු ඇතුළත් කරන්න.

2) නියාමක තනතුරට අදාළ සේවා කාලය තුළ ලබා ඇති

**ප්‍රශංසා ගණන**

I. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

II. බන්ධනාගාර අධිකාරි

3) පැමිණීමේ දින ගණන :-

2011.03.31 සිට 2012. 03.31 දක්වා දින ගණන -

2012.03.31සිට 2013. 03.31 දක්වා දින ගණන -

2013.03.31 සිට 2014. 03.31 දක්වා දින ගණන -

2014.03.31 සිට 2015. 03.31 දක්වා දින ගණන -

2015.03.31 සිට 2016. 03.31 දක්වා දින ගණන -

ඉහත නම සඳහන් නිළධාරියා/නිළධාරිනිය මෙම ආයතනයේ සේවය කරන බවත්, 2016.03.31 දිනට පූර්වාසන්න වසර 05 තල සියළු වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, පූර්වාසන්න වසර 03 තුල අවවාද කිරීමට දඬුවමක් ලබා නොමැති බවත් සහතික කරන අතර, නිළධාරියා/ නිළධාරිනියගේ වැඩ , පැමිණීම සතුටුදායක බැවින් සැරයන් තනතුරට උසස් කිරීමට නිර්දේශ කරමි.

දිනය : ........................................... බන්ධනාගාර අධිකාරි : ..........................................